# සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව
# கூட்டுறவு அபிவிருத்தி திணைக்களம்
# DEPARTMENT OF CO-OPERATIVE DEVELOPMENT


දුරකථනය / தொலைபேசி / Telephone: 011-2478373, 011-2478374, 011-2478376

තැ.පෙ.419, අංක 330, යුනියන් පෙදෙස, කොළඹ 02
த.பெ. இல. 419, இல. 330, யூனியன் பிளேஸ், கொழும்பு 02
P.O.Box 419, No. 330, Union Place, Colombo 02

ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2478386, 011-2478377

විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / e-mail: info@coop.gov.lk, depcoopdev@gmail.com

වෙබ් අඩවිය / இணையத்தளம் / Web Site: www.coop.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: ස.සං.දෙ/බැංකු/2/4/9

ඔබේ අංකය / உமது இல. / Your No.:

දිනය / திகதி / Date: 2022.12.08

මුදුන් මට්ටමේ මූල්‍ය සේවා සමුපකාර සමිති / සංගම්වල
ගරු සභාපතිවරුන් වෙත,

**සමුපකාර ග්‍රාමීය බැංකු සකසුරුවම්, ණය දෙන සමිති, සමුපකාර ග්‍රාමීය බැංකු සංගම් සහ සණස සංගම් විසින් අතිරික්ත මුදල් තැන්පත් කිරීම සහ ආයෝජනය කිරීම**

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිය වෙබ් අඩවියේ පල කරන ලද "අනවසර මුදල් ව්‍යාපාර සහ තැන්පතු රැස්කිරීම" පිළිබඳව උපදෙස් පත්‍රිකා දෙකක් සහ Perpetual Treasuries Limited (PTL) ආයතනයේ ව්‍යාපාර කටයුතු අත්හිටුවීමේ දැන්වීමේ පිටපතක් මේ සමඟ ඉදිරිපත් කරමි.

ඔබ විසින් නියාමනය කරනු ලබන මූල්‍ය සේවා සමිති වල අතිරික්ත අරමුදල් මෙම මූල්‍ය සමාගම් දෙකෙහි තැන්පත් කර ඇත්නම් අප්‍රමාදව ඒවා අයකර ගැනීමට කටයුතු කල යුතු අතර ඉහත සඳහන් ප්‍රාථමික අලෙවිකාර ආයතනය හෝ එහි අධ්‍යක්ෂකවරුන්ට අයත් මූල්‍ය ආයතනයන්හි රාජ්‍ය සුරැකුම්පත් වල අයෝජනය නොකිරීමට පියවර ගන්නා මෙන් කාරුණිකව දන්වා සිටිමි.

ජී.ඩී.කීර්ති ගමගේ
සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ
සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්

පිටපත
01. අධ්‍යක්ෂ ජනරාල්
ජාතික සමුපකාර සංවර්ධන ආයතනය
පොල්ගොල්ල - කරු.දැ.ගැ.පි සහ අ.ක.ස

## මහජනතාව වෙත කරනු ලබන නිවේදනයයි

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

# අනවසර මුදල් ව්‍යාපාර සහ තැන්පතු රැස්කිරීම

## ඇතන්ස් ඉන්ටර්නැෂනල් එඩියුකේෂන් සෙන්ටර් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ හෙට්ටි ආරච්චිලාගේ සහන් අකලංක

2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතෙහි 42 වන වගන්තිය යටතේ සිදු කරන ලද විමර්ශනයකින් අනතුරුව ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් 2022.09.02 දින පැවති මුදල් මණ්ඩල රැස්වීමේ දී;

අ) අංක 42/5 ඒ, දෙවන හරස් වීදිය, නව නගරය, පොළොන්නරුව යන ස්ථානයේ ලියාපදිංචි ඇතන්ස් ඉන්ටර්නැෂනල් එඩියුකේෂන් සෙන්ටර් (ප්‍රයිවට්) ලිමිටඩ් (පීවී00221899) යන සමාගම; සහ

ආ) අංක 45/5 ඒ, දෙවන හරස් වීදිය, නව නගරය, පොළොන්නරුව යන ලිපිනයෙහි පදිංචි ඇතන්ස් ඉන්ටර්නැෂනල් එඩියුකේෂන් සෙන්ටර් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂ වන හෙට්ටි ආරච්චිලාගේ සහන් අකලංක (951980234වී);

යන අය විසින් එකී පනතෙහි ප්‍රතිපාදනයන් උල්ලංඝනය කරමින් මුදල් ව්‍යාපාර සිදු කළ බවට සහ තැන්පතු භාරගත් බවට තීරණය කර ඇති බව මුදල් ව්‍යාපාර පනතෙහි 42 (10) වන වගන්තිය යටතේ මහජන සුභසිද්ධිය පිණිස මහජනයා වෙත දැනුම් දීම සඳහා මෙම දැන්වීම පළකරනු ලැබේ.

ඒ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් ඉහතින් සඳහන් කරන ලද සමාගමට සහ පුද්ගලයාට තවදුරටත් අවබෝධතා ගිවිසුම් පත්‍රිකා නිකුත් කිරීම හරහා හෝ වෙනත් කිසිදු ආකාරයකින් තැන්පතු භාරගැනීම සහ මුදල් ව්‍යාපාර කටයුතු කරගෙන යාම සිදු නොකරන ලෙසටත් විධාන කර ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුව මේ වන විටත් ඉහතින් සඳහන් කරන ලද සමාගමට සහ පුද්ගලයාට කිසිදු ආකාරයකින් තැන්පතු හෝ මුදල් ලබා ගැනීම, ණය ලබා දීම, නව ආයෝජනයන් සිදු කිරීම, වත්කම් විකිණීම හෝ පැවරීම, යම් ගිණුමකට, දේපළකට, ආයෝජනයකට අදාලව සියළු ගණුදෙනු සිදු කිරීම තහනම් කරමින් එවැනි කටයුතු ක්‍රියාවිරහිත කිරීමේ නියෝග නිකුත් කර ඇත.

මුදල් මණ්ඩලය
ශ්‍රී ලංකා මහ බැංකුව

ශ්‍රී ලංකා මහ බැංකුව
අංක 30, ජනාධිපති මාවත, කොළඹ 01
දුරකථන: 0112477504, 0112398860, 0112398863 විද්‍යුත් ලිපිනය: dsnbfi@cbsl.lk වෙබ් අඩවිය: http://www.cbsl.gov.lk

## මහජනතාව වෙත කරනු ලබන නිවේදනයයි

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

# අනවසර මුදල් ව්‍යාපාර සහ තැන්පතු රැස්කිරීම

## ඩබ්ලිව් ටී එස් ඉන්වෙස්ට්මන්ට් ප්‍රයිවට් ලිමිටඩ්, වීරසිංහගේ තාරක සදරුවන් වීරසිංහ සහ තුෂාරි බුද්ධිකා විජේනායක

2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතෙහි 42 වන වගන්තිය යටතේ සිදු කරන ලද විමර්ශනයකින් අනතුරුව ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් 2022.06.01 දින පැවති මුදල් මණ්ඩල රැස්වීමේ දී;

අ) අංක ඒ 12, අලුත් මග පාර, හොරොව්පතාන යන ස්ථානයේ පිහිටා ඇති ඩබ්ලිව් ටී එස් ඉන්වෙස්ට්මන්ට් ප්‍රයිවට් ලිමිටඩ් (පීවී00225992) යන සමාගම;

ආ) අංක 35, රළපනාව, හොරොව්පතාන, අනුරාධපුර යන ලිපිනයෙහි පදිංචි, ඩබ්ලිව් ටී එස් ඉන්වෙස්ට්මන්ට් ප්‍රයිවට් ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂවරයෙකු වන වීරසිංහගේ තාරක සදරුවන් වීරසිංහ (912830357වී);

සහ

ඇ) අංක 64 ඒ, යාපනය පාර, අනුරාධපුර යන ලිපිනයෙහි පදිංචි, ඩබ්ලිව් ටී එස් ඉන්වෙස්ට්මන්ට් ප්‍රයිවට් ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂවරියක වන තුෂාරි බුද්ධිකා විජේනායක (726201374වී)

යන අය විසින් එකී පනතෙහි ප්‍රතිපාදනයන් උල්ලංඝනය කරමින් මුදල් ව්‍යාපාර සිදු කළ බවට සහ තැන්පතු භාරගත් බවට තීරණය කර ඇති බව මුදල් ව්‍යාපාර පනතෙහි 42 (10) වන වගන්තිය යටතේ මහජන සුභසිද්ධිය පිණිස මහජනයා වෙත දැනුම් දීම සඳහා මෙම දැන්වීම පළකරනු ලැබේ.

ඒ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් ඉහතින් සඳහන් කරන ලද සමාගමට හා පුද්ගලයින්ට,

අ) තවදුරටත් ආයෝජන සැලසුම් නිකුත් කිරීම හරහා හෝ වෙනත් කිසිදු ආකාරයකින් තැන්පතු භාරගැනීම සහ මුදල් ව්‍යාපාර කටයුතු කරගෙන යාම සිදු නොකරන ලෙසටත්,

සහ

ආ) සමාගම් රෙජිස්ට්‍රාර්වරයා විසින් සමාගම් නාම ලේඛනයෙන් ඩබ්ලිව් ටී එස් ඉන්වෙස්ට්මන්ට් ප්‍රයිවට් ලිමිටඩ් සමාගමේ නම කපා හැරී බවට පිළිගත හැකි සාක්ෂි 2022.12.01 දිනට පෙර ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කරන ලෙසටත්

විධාන කර ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුව මේ වන විටත් ඉහතින් සඳහන් කරන ලද සමාගමට සහ පුද්ගලයින්ට කිසිදු ආකාරයකින් තැන්පතු හෝ මුදල් කැඳවීම සහ රැස්කිරීම, වත්කම් බැහැර කිරීම / අන්සතු කිරීම, යම් ගිණුමකට, දේපළකට, ආයෝජනයකට හෝ සම්බන්ධ ගණුදෙනුවකට ඇතුළුවීම තහනම් කරමින් එවැනි කටයුතු ක්‍රියාවිරහිත කිරීමේ නියෝග නිකුත් කර ඇත.

මුදල් මණ්ඩලය
ශ්‍රී ලංකා මහ බැංකුව

ශ්‍රී ලංකා මහ බැංකුව
අංක 30, ජනාධිපති මාවත, කොළඹ 01
දුරකථන: 011-2477504, 011-2398860, 011-2398863 විද්‍යුත් ලිපිනය: dsnbfi@cbsl.lk වෙබ් අඩවිය: http://www.cbsl.gov.lk

# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA


| | |
|---|---|
| නිකුත් කළේ | බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව |
| දිනය | 2022.07.05 |

## පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගමෙහි ව්‍යාපාර කටයුතු අත්හිටුවීම දීර්ඝ කිරීම

ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනත හා දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත යටතේ නිකුත් කරන ලද නියෝගයන්ට අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කරනු ලබන විමර්ශන කටයුතු තවදුරටත් සිදුකරගෙන යාමේ අරමුණින්, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින්, පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගමේ ප්‍රාථමික අලෙවිකරුවෙකු විසින් කරනු ලබන ව්‍යාපාර කටයුතු සහ ක්‍රියාකාරකම් අත්හිටුවීම, 2022 ජූලි මස 05 වැනි දින ප.ව. 4.30 සිට බලපැවැත්වෙන පරිදි මාස හයක (06) කාලසීමාවක් සඳහා තවදුරටත් දීර්ඝ කිරීමට තීරණය කරන ලදී.